CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තුව හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ධම්මික පෙරේරා මහතා පත්කිරීමේ ව්‍යවස්ථාපිතභාවය පිළිබඳ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි ප්‍රකාශය.

2022 ජුනි 10: බැසිල් රාජපක්ෂ මහතාගේ ඉල්ලා අස්වීමෙන් පසු පුරප්පාඩු වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරය සඳහා සඳහා ධම්මික පෙරේරා මහතා පත් කර ඇති බවට පළ වූ මාධ්‍ය වාර්තා කිහිපයක් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කනස්සල්ලට පත්ව සිටී. මාධ්‍ය වාර්තාවලට අනුව බලන කල, ධම්මික පෙරේරා මහතා මීට දින කිහිපයකට පෙර ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකයෙකු නොවූ බවත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 වන ව්‍යවස්ථාව ප්‍රකාරව (''ජාතික ලැයිස්තුව'') වර්ෂ 2020 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙස තේරී පත්වීමට සුදුසුකම් ඇති පුද්ගලයින්ගේ ලැයිස්තුවට ඔහුගේ නම ඇතුළත් නොවූ බවත් මෙන්ම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විසින් ඉදිරිපත් කරන ලද කිසිදු දිස්ත්‍රික් ලැයිස්තුවක් තුළ ඔහුගේ නම පිළිබඳ සඳහනක් නොවූ බවද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී සඳහන් කර සිටී.

ධම්මික පෙරේරා මහතාට ආර්ථිකයේ වැදගත් අංශ කිහිපයක් ආවරණය වන පරිදි රාජ්‍ය සහ පෞද්ගලික සීමිත සමාගම් කිහිපයක ව්‍යාපාරික ලැදියාවන් ඇත. පෙරේරා මහතා නීති සම්පාදකයෙකු ලෙසත්, සමහරවිට අනාගත අමාත්‍යවරයෙකු ලෙසත් ගනු ලබන තීරණ මෙම සමාගම් සහ ඒවා අදාළ ක්ෂේත්‍ර කෙරෙහි සැලකිය යුතු හා ඍජු බලපෑමක් ඇති කරනු ලබන අතර එමඟින් ඍජුවම ලැදියාවන් අතර ගැටුමක් ඇති වේ. කෙසේ වෙතත්, සැලකිය යුතු මූල්‍ය ප්‍රතිලාභ ලැබීමට ඔහුට හිමිකම් ඇති බව පෙනී යන බැවින්, සමාගම් තුළ දරණ නිල තනතුරුවලින් පෙරේරා මහතා හුදෙක් ඉල්ලා අස්වීමෙන් පමණක් මෙම ලැදියාවන් පිළිබඳ පිළිගැටුම් තත්ත්වය විසඳෙන්නේ නැත. වර්ෂ 2020 අගෝස්තු මාසයේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කරන විට පෙරේරා මහතා පාර්ලිමේන්තුවට පත්වීමේ හැකියාව පිළිබඳව ශ්‍රී ලංකාවේ පුරවැසියන් දැන සිටිය යුතුව තිබුණේ මන්ද යන්න මගින් මෙම තත්ත්වයන් වඩාත් වැදගත් කරුණක් බවට පත් කරයි. මීට අමතරව, පෙරේරා මහතාට ලැදියාවක් ඇති ව්‍යාපාර, ''රාජ්‍යය හෝ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් හෝ විසින් සාදන ලද'' කොන්ත්‍රාත්තුවලට ඇතුල් වන්නේ නම් මෙන්ම එය දිගටම කරගෙන යන්නේ නම්, එවන් තත්ත්වයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91(1)(ඊ) ව්‍යවස්ථාවෙන් පෙන්වා දී ඇති විධිවිධාන උල්ලංඝනය කිරීමක් විය හැකිය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ස්ථාවරය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව එවැනි පුරප්පාඩුවක් පිරවීම සඳහා නම් කිරීමට හිමිකම් ඇත්තේ දිස්ත්‍රික් නාමයෝජනා පත්‍රවල හෝ දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කරන ලද ජාතික ලැයිස්තුවක නම ඇතුළත් වූ අයෙකුට පමණක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වීමේ හැකියාව ඇති බවයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගෙන ගොස් ඇති අතර මීට පෙර එවැනි පත්වීම් සිදු කරන විට අධිකරණයේදී එවැනි පත්වීම් කිහිපයක් අභියෝගයට ලක් කිරීම ඇතුළුව එවන් තත්ත්වයන් සම්බන්ධයෙන් ස්වකීය කනස්සල්ල පෙන්වාදීමට සහ අවධානය යොමු කරවීමට කටයුතු කර ඇත. එක්සත් ජාතික පක්ෂය (එජාප) විසින් සරත් ෆොන්සේකා මහතා ජාතික ලැයිස්තු පත් කිරීම අභියෝගයට ලක් කරමින් වර්ෂ 2016 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නඩුවක් ගොනු කරන ලදී. එම නඩුවේදී, ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට යාමට අවසර දීම ප්‍රතික්ෂේප කළ නමුත් ඒ සම්බන්ධයෙන් හරයාත්මක හේතු සහිත නියෝගයක් නිකුත් නොකළේය. වර්ෂ 2020 ජනවාරි මාසයේදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සමන් රත්නප්‍රිය මහතා සහ බැසිල් රාජපක්ෂ මහතා පත් කිරීම සමාන පදනමක් මත විවේචනය කරන ලදී.

CPA

CENTRE FOR POLICY ALTERNATIVES

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

එක්සත් ජාතික පක්ෂය, එක්සත් ජනතා නිදහස් සන්ධානය / පොදුජන පෙරමුණ මීට පෙර අවස්ථා වලදී පාර්ලිමේන්තුවට මෙවැනිම පත්වීම් ලබාදී ඇති බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී සඳහන් කරනු ලබයි. දේශපාලන පක්ෂ වලට එවැනි පුරප්පාඩුවක් පිරවීම සඳහා දේශපාලන පක්ෂයේ "ඕනෑම සාමාජිකයෙකු" පත් කිරීමට ඔවුන්ට බලය පැවරෙන 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වගන්තිය මුවාවෙන් මේ අන්දමින් කටයුතු කරනු ලැබේ. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ ඉහත සඳහන් විධිවිධාන හරහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි වශයෙන් පෙන්වා දී ඇති මෙන්ම ව්‍යංගාර්ථයෙන් ඇති විධිවිධාන, විශේෂයෙන්ම 99අ සහ 101(ඍ) ව්‍යවස්ථාවන් උල්ලංඝනය කරන බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පෙන්වා දෙනු ලැබේ. 64 (5) වගන්තිය පැහැදිලිවම ව්‍යවස්ථා විරෝධී වුවද, එය වලංගු වන්නේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතියක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉඩ නොදෙන නිසා පමණි.

මීට අමතරව, අදාළ මැතිවරණයේදී දේශපාලන පක්ෂයක නාම යෝජනා සඳහා නම ඉදිරිපත් නොකළ ''ඕනෑම සාමාජිකයෙකු'' පත්කිරීමේ පරිචය, ජනතා පරමාධිපත්‍යයේ කොටසක් වන ජනතා ඡන්ද බලය උල්ලංඝනය කරනු ලබයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි ජනරජයේ පරමාධිපත්‍ය හිමිවන්නේ ජනතාව නම්, දේශපාලන පක්ෂය විසින් පාර්ලිමේන්තුවට පත් කිරීමට අදහස් කරන්නේ කවුරුන්ද යන්න මැතිවරණයකට පෙර ජනතාව දැනගත යුතුය.

ඒ සඳහා සැකසෙන පුරප්පාඩු සඳහා දේශපාලන පක්ෂවලට අවශ්‍ය අය පත් කිරීමට ඉඩ දීමෙන් සිදුවන්නේ ජනතා ඡන්ද බලයේ වටිනාකම හෑල්ලුවට ලක්වන අතර දේශපාලන පක්ෂ නායකත්වයේ බලය අනවශ්‍ය හා අත්තනෝමතික ලෙස ඉස්මතු කර පෙන්වා ගැනීමකි. ජාතික ලැයිස්තුවේ ව්‍යවස්ථාපිත අරමුණ වන්නේ මැතිවරණ ක්‍රියාවලිය හරහා පාර්ලිමේන්තු නියෝජනයක් නොලැබෙන මහජන මතයේ කොටස් සහ කුඩා සුළු ජාතීන් සඳහා නියෝජනය සහතික කිරීමයි. එය කිසිදු දේශපාලන පක්ෂයක පටු ආත්මාර්ථකාමිත්වයට හෝ කිසිඳු පුද්ගලයෙකුගේ අභිලාෂයන් සඳහා පහසුකම් සැලසීමට නොවේ.

මේ අනුව, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ අනෙකුත් සියලුම දේශපාලන පක්ෂවලින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඉල්ලා සිටිනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි විධිවිධානවලට සහ ජනතාවගේ ඡන්ද බලයට ගරු කරන ලෙසයි. පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාවට සහ 101(ඍ) ව්‍යවස්ථාවට අනුකූලද යන්න පිළිබඳව ඇති සැකයන් දුරු කිරීම සඳහා එය සංශෝධනය කිරීමට පියවර ගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටී.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org